# City NEWS

MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිළ ඊ පුවත් පත

කලාප 09

2023 ජූලි 01


# මහල් නිවාස ලාභීන්ට ඔප්පු 90000ක්

**අමිල දර්ශන හේරත්**

රාජ්‍ය හා පුද්ගලික අංශයේ මහල් නිවාස ලාභීන් සඳහා මේ වනවිට ඔප්පු 90000ක් පමණ ලබාදී අවසන් බව සහාධිපත්‍ය කළමණාකරණ අධිකාරිය පවසයි. එහි සභාපති නීතීඥ සරණ කරුණාතිලක මහතා පවසන්නේ මහල් නිවාසලාභීන් සඳහා ඔප්පු ලබාදීමේ වැඩ පිළිවෙල තවදුරටත් ක්‍රියාත්මක කරන බවයි.

පිටුව 02

# "ලක්සියනෑ මැදුර"

අභිනවයෙන් ඉදි කෙරුනු ගම්පහ දිස්ත්‍රික් ලේකම් පරිපාලන සංකීර්ණය හෙවත් "ලක්සියනෑ මන්දිරය" ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ සහ අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ජනතා අයිතියට පත් කෙරිණි.

භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 4000 කට ආසන්න මුදලක් වැයවී කරමින් ඉදිකෙරුණු මහල් නවයකින් යුතු මෙම පරිපාලන සංකීර්ණය වර්ග අඩි 2,25,000 කින් සමන්විතවේ.





සේයා රූ - නලින් හේවාපතිරණ



# ඉදිකිරීම් කටයුතු නතරව තිබෙන ගොඩනැගිලිවල

## ඩෙංගු මදුරුවන් බෝවීම නතර කිරීමට අවශ්‍ය පියවර ගන්න...

ඇමති ප්‍රසන්නගෙන් නිළධාරීන්ට උපදෙස්

**නාලක දහනායක**

ඉදිකිරීම් කටයුතු නතරව තිබෙන ගොඩනැගිලිවල ඩෙංගු මදුරුවන් බෝවීම නතර කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස නාගරික සංවර්ධනය අධිකාරියට, ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අනෙකුත් ආයතනවලට උපදෙස් දී තිබෙන බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

පිටුව 02

# නතරවූ ඉදිකිරීම් වසරකින් නිම කෙරේ...

**ව්‍යාපෘති ආරම්භ කිරීම සම්බන්ද යෝජනා ඇතුළත් වාර්තාවක් දෙන්න**

**අමාත්‍යංශ ලේකම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉල්ලයි.**

**නිහාර චාමික පෙරේරා**

මේවනවිට ඉදිකිරීම් කටයුතු අතරමඟ නතරව ඇති ව්‍යාපෘතිවල සියලුම කටයුතු ඉදිරි වසරක කාලයක් ඇතුළතදී නිමකිරීමට බළාපොරොත්තුවන බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්ලියු.එස් සත්‍යානන්ද මහතා පවසයි.

ඒ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා මුදල් අමාත්‍යංශ නිළධාරීන් සමඟ මේ වනවිටත් සාකච්ඡා කරමින් සිටින බවද හෙතෙම සඳහන් කළේය.

පිටුව 02

# බස්නාහිර පළාතේ පාසල්වල අබලන්වූ ගොඩනැගිලි පිලිසකර කෙරේ...

**ඇමති ප්‍රසන්නගෙන් පළාත් අධ්‍යාපන ලේකම්ට උපදෙස්..**

**නාලක දහනායක**

බස්නාහිර පළාතේ පාසල්වල අබලන්වූ ගොඩනැගිලි පිලිසකර කිරීමේ කඩිනම් ව්‍යාපෘතියක් අරඹන ලෙසට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග පළාත් අධ්‍යාපන ලේකම්වරයාට උපදෙස් දුන්නේය.

එමෙන්ම නිරන්තරයෙන්ම පාසල්වල ප්‍රථිඵල විශ්ලේෂණය කිරීමේ ක්‍රමවේදයක් සකසන ලෙසද අමාත්‍යවරයා අවධාරණය කළේය.

අමාත්‍යවරයා සඳහන් කළේ පාසල්වල ඇති අඩක් නිම කළ ගොඩනැගිලි රාශියක් තිබෙන බවයි. තිබෙන ආර්ථික පහසුකම් අනුව මේ ගොඩනැගිලි පිළිසකර කරන්න බලාපොරොත්තු වෙන බවද ඔහු කීය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ **City News** නිළ ඊ පුවත්පත සඳහා පිවිසෙන්න

## නතරවූ ඉදිකිරීම් වසරකින් නිම කෙරේ...

ඉදිකිරීම් කටයුතු අතරමග නතරව ඇති ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් වන යෝජනා හ අදහස් ඇතුළත් ව්‍යාපෘති වාර්තාවක් සතියක් ඇතුළතදී තමන්ට ලබාදෙන ලෙසද අමාත්‍යංශ ලේකම්වරයා කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් දුන්නේය.

එම ව්‍යාපෘති වාර්තා අධ්‍යයනය කොට විෂයභාර අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාට ඉදිරිපත්කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවද අමාත්‍යංශයේ ලේකම්වරයා වැඩිදුරටත් කීවේය.

## ඉදිකිරීම් කටයුතු නතරව තිබෙන ගොඩනැගිලිවල...

අමාත්‍යවරයා පවසන්නේ ජාතික වගකීමක් ලෙස සලකා ඩෙංගු රෝගය පාලනය කිරීමට සියලු පුරවැසියන් එකව කටයුතු කළ යුතු බවයි.
එසේ නොවුනහොත් මෙය ඉතාම භායානක තත්ත්වයක් විය හැකි බවද ඔහු අනතුරු හැඟවීය.

එමෙන්ම ඩෙංගු රෝගය පාලනය කිරීම සඳහා රජය ඉතා තද තීන්දු තීරණ ගන්නා බවද අමාත්‍යවරයා කීය.
ඩෙංගු මදුරු මර්ධනය සඳහා විශාල දායකත්වයක් ලබාදෙන පළාත් පාලන ආයතනවල සේවයේ නියුතු සේවකයන් ස්ථිර කරන ලෙසට රජයෙන් ඉල්ලීමක් කර තිබෙන බවද ඔහු පැවසීය.

**උපදේශකත්වය**
ඇමතිතුමාගේ මාධ්‍ය ලේකම්
ප්‍රදීප් අනුර කුමාර
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
**සංස්කරණය**
නාලක දහනායක
**පිටු සැකසුම**
ධනුෂිකා කුමාරි
**විශේෂාංග ලිපි**
නාලක දහනායක
නිහාර චාමික පෙරේරා
අමිල දර්ශන හේරත්
මුනීරා අබු බක්කර්
**සෝදුපත් බැලීම**
පී.බී.එස්. සම්පත්
**සම්බන්ධීකරණය**
දිලිනි කෞෂල්‍යා
නදුන් තාරක
නිලංක නිරෝෂන්
**ඡායාරූප**
නුවන් දිනේන්ද්‍ර
නලින් හේවාපතිරණ
සරත් ජයතිලක
**පරිගණක සහය**
සචිදු සංකල්ප
තිළිණ නිර්මාල්

## ලක්ෂියනෑ මන්දිරය...

ආසන 1000 කින් යුතු නවීන ශ්‍රවණාගාරයක් සහ ආසන 400 කින් යුතු නව ආපන ශාලාවක් මෙන්ම නව වාහන අංගනයක්ද මෙයට ඇතුළත්ව.
මෙම පරිපාලන සංකීර්ණය විවෘත කිරීමත් සමග මෙතෙක් කලක් ගම්පහ නගරයේ විවිධ ස්ථානවල පවත්වා ගෙන ගිය ප්‍රධාන රාජ්‍ය ආයතන 28 ක් පමණ මෙම සංකීර්ණය වෙත ගෙන ඒමට නියමිතය.
මෙම අවස්ථාවට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා ඇතුළු මැති ඇමතිවරුන් රාශියක් සහභාගී විය.

## මහල් නිවාස...

සහාධිපත්‍ය කළමණාකරණ අධිකාරිය යනු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි. එම ආයතන මගින් සිදුකෙරෙන්නේ තට්ටු නිවාස නියාමනය කිරීමය.

# කතු වැකිය

## උරුමය සුරකිමු...!

ඉතිහාසය හා මහා වංශය වැනි මුලාශ්‍ර පිළිබඳව යමෙකුට මතවාද තිබිය හැකිය. එහෙත් රටක පුරාවිද්‍යාත්මක උරුමය අතීත මානව වර්ගයාගේ පැවැත්ම හා ක්‍රියාකාරකම් පිළිබඳ මූලික වාර්තාවකි. මෙකී පුරාවිද්‍යාත්මක උරුමයන් සකලවිධ ජාතීන්ට පොදු වස්තුවකි. සැබවින්ම රටකට පුරාවස්තුන් සම්පත් ආකරයකි.
ලෝක උරුමයන් ලෙස සැලකෙන ස්ථාන හතක් අප රට තුළ තිබීම සම්බන්ධව ශ්‍රී ලාංකිකයන් වශයෙන් අප ආඩම්බරයට පත්විය යුතු කරුණකි. මීට අමතරව මේ පුංචි දිවයින තවත් පුරාවිද්‍යාත්මක ස්ථාන රැසකින් සමන්විතය. එහෙත් මෙකී ලෝක උරුමයන් මෙන්ම අනිකුත් පුරාවිද්‍යාත්මක ස්ථානද වර්තමානයේ අතිශය ඛේදනීය තත්ත්වයකට පත්වෙමින් තිබෙන්නේය.
මතු පරපුර වෙනුවෙන් මෙකී උරුමයන් රැක ගැනීම සඳහා බහුතරයක් වූ පහළ ස්ථරයේ ජනතාව දැනුවත් කිරීමට කටයුතු කිරීම පුරාවිද්‍යා බලධාරීන්ගේ වගකීමකි .ඒ සඳහා අනාගත පරපුරට ඉතිහාසය ඉගැන්විය යුතුය. එසේ නොවුනහොත් අපේ සංස්කෘතික සම්පත් විනාශය දිනෙන් දිනම උග්‍රවන්නට පුළුවන. මේ නිසා මතු පරපුර වෙනුවෙන් ලෝක උරුමයන් හා පුරාවිද්‍යාත්මක ස්ථාන සුරැකීමට අප සියලු දෙනාම පෙළ ගැසිය යුතුය.

## රාජ්‍ය පෞද්ගලික අංශයේ

**පිළිතුර -** කොළඹ තිබෙන තට්ටු 72ක ක්‍රිෂ් ගොඩනැගිල්ල දැකලා ඇති. සංවර්ධනකරුවන් එය සම්පූර්ණයෙන් අතහැර දමා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ක්‍රියාදාමය ඉදිරියට යන්නේ නැති නිසා. ජනාධිපතිතුමාට, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාට මේ සම්බන්ධයෙන් ලිඛිතව දැනුම් දුන්නා නැවත පවරගෙන විදේශ ආයෝජකයින්ට ලබා දෙන්න කියලා. ඩෙස්නිනි කියලා කොල්ලුපිටියේ ස්ටේෂන් එකට එහා පැත්තේ එකක් තිබෙනවා පකිස්ථාන ආයෝජකයා හොයා ගන්නත් නෑ. ඒක දාලා ගිහිල්ලා. මිනිස්සු ඒවාට සල්ලි ආයෝජනය කරලා ඒවාගේ මිනිස්සු ගෙවල් අරගෙන. ඒවා පොදු ජනතාවගේ මුදල්. සංවර්ධනය ඉදිරියට යන්නේ නෑ. අපි යෝජනා කළා අමාත්‍යාංශයට අතහැර දමා ගිහින් තිබෙන ගොඩනැගිලිවලට සහාධිපත්‍ය දේපල සම්බන්ධයෙන් මැදිහත් වෙන්න කියලා. අපි බලාපොරොත්තු වෙනවා නිසි විදෙස් ආයෝජකයින් හොයා ගෙන නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කරලා මේ ව්‍යාපෘති තව දුරටත් වේගවත් කරන්න.

මාධ්‍ය ඒකකය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහළ
සෙත්සිරිපාය
බත්තරමුල්ල
94 11 286 7163
94 11 286 5479
paper.citynews@gmail.com



නීතිඥ සරණ කරුණාරත්න
සභාපති
සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

# රාජ්‍ය පෞද්ගලික අංශයේ මහල් නිවාසලාභීන්ට ඔප්පු 90,000කට වැඩි ප්‍රමාණයක් ලබාදී අවසන්

**ප්‍රශ්නය -** සහාධිපත්‍ය දේපල කියන්නේ මොකක්ද? ඒ වගේම මේ ආයතනය ගැන හැඳින්වීමක් කළොත්?

**පිළිතුර -** මුලින් 1973 දී මහල් නිවාස ක්‍රියාත්මක කරන්න පොදු නිවාස පහසුකම් මණ්ඩලය ඇති කරනවා. ඒකේ දිගුවක් ලෙස 2003 දී සාහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ස්ථාපිත කරනවා. අධිපතිත්වය සමානව තිබෙන තැන් සම්බන්ධයෙන් තමයි සහාධිපත්‍ය දේපලක් කියලා කියන්නේ. ඒකක එකකට වැඩි ප්‍රමාණයකින් හා පොදු අංග උපාංග සහ පොදු පහසුකම් සහිත නිවාස ඒකකයක් සහාධිපත්‍ය දේපලක් විදියට හඳුන්වනවා. සරළවම කිව්වොත් තට්ටු නිවාස. ඒවගේ පොදු පහසුකම් තිබෙනවා. මේ සියල්ලම නියාමනය කිරීම තමයි සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ මූලික රාජකාරිය වනුයේ.

**ප්‍රශ්නය -** වර්තමානයේදී භාවිතයට ගන්න බැරි නිවාස සංකීර්ණ 08ක් හඳුනාගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබ අධිකාරිය කුමන පියවරක්ද ගන්න බලාපොරොත්තු වන්නේ?

**පිළිතුර -** 1973 වසරේ ආරම්භ කළ තට්ටු නිවාස (කම්කරුපුර, සිරිධම්ම මාවතේ නිවාස මහල් නිවාස ව්‍යාපෘතිය, වැකන්ද නිවාස යෝජනා ක්‍රමය - කොළඹ 02, මාලිගාවත්තේ කොටස් කිහිපයක්, මිහිඳු මාවත නිවාස යෝජනා ක්‍රමය) දැනට භාවිතයට ගත නොහැකි පරිදි පොදු පහසුකම් හා ගොඩනැගිල්ලේ තිබෙන ශක්තිය පිළිබඳවත් විශාල ගැටළු රැසක් පැන නැග තිබෙනවා. පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව මේවා නැවත කඩා ඉවත් කර පුනඃස්ථාපනය කරන්න අපිට හැකියාවක් තිබෙනවා. වැඩිම සහාධිපත්‍ය දේපලක් තිබෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයේයි. එවැනි දේපල 08 ක් සම්බන්ධයෙන් අපි හඳුනාගැනීමක් සිදු කර අමාත්‍යාංශයට දැනුවත් කිරීමක් සිදු කර තිබෙනවා. ඒ ක්‍රියාදාමය සිදු කරන්න රජයට මූල්‍යමය ගැටළු තිබෙනවා කියලා. එම නිසා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ එම කටයුත්ත කරන්න.

සුගතදාස ක්‍රීඩාංගණය අසල තිබෙන කොළඹ වේල්ස් කුමර නිවාස යෝජනා ක්‍රමය. එය තට්ටු තුනකින් සමන්විතයි. තට්ටු විශාලා ගාණකින් යුත් නිවාස ව්‍යාපෘතියක් ඉදිකරන්න පුළුවන් වටිනා ඉඩමක්. එම නිවාස යෝජනා ක්‍රමය ඇති කර රජයටත් පෞද්ගලික අංශයටත් ලාබ ලැබිය හැකි ආකාරයට නැවත සිදු කරන්න කටයුතු කරනවා. කුඩා භූමියක උපරිමව ඵලයක් ලබා ගත යුතුයි. එවැනි නිවාස යෝජනා ක්‍රමයක් ඉදිරිපත් කිරීම සඳහා පෞද්ගලික අංශය සමඟ සාකච්ඡා කර අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට රජයට අපි දැනුවත් කිරීම් කරලා තිබෙනවා.

**ප්‍රශ්නය -** මහල් නිවාසවල ජීවත් වන ජනතාවට ඔප්පු කොපමණ ප්‍රමාණයක් දී තිබෙනවාද?

**පිළිතුර -** හුගක් නිවාස වල ඔප්පු ලබා දීම අවසන් කර තිබෙනවා. ඉලක්කම් වශයෙන් කියන්න බෑ. නමුත් රජයේ අලුත් ප්‍රතිපත්ති අනුව ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා නිවාස වලට ඔප්පු ලබා දිය යුතු බව. ඒ සම්බන්ධයෙන් කඩිනම් වැඩපිළිවෙලක් ජනාධිපති ලේකම්තුමාගේ මූලිකත්වයෙන් අපට කමිටුවක් තිබෙනවා ඒ කමිටුවේ මමත් හිටියා. ඒ සඳහා ක්‍රියාදාමයක් අනුගමනය කර ඔප්පු ලබා දීම වේගවත් කිරීමට කටයුතු යොදා තිබෙනවා. දැනට සාමාන්‍යයෙන් නිවාස 90,000කට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය පෞද්ගලික අංශවල ඔප්පු ලබා දීම කර තිබෙනවා.

**ප්‍රශ්නය -** කොළඹ තිබෙන වාණිජමය වටිනාකම වැඩි ඉඩම් එක එක්කෙනා අල්ලගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාන්ලාට මැදිහත් වීමක් කරන්න පුළුවන්ද?

පිටුව 02

නාලක දහනායක



චමිල හේරත්
සභාපති
ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

# සැප්තැම්බරයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වෙනසක් සිදුවේවි

**ප්‍රශ්නය -** මෙම ආයතනය තමයි ගොඩනැගිලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් තිබෙන ප්‍රධානතම රාජ්‍ය ආයතනය. ගොඩනැගිලි අමුද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සොයා බැලීමට පසුගියදා සාකච්ඡාවක් තිබුණා. එම වැඩපිළිවෙලේ වත්මන් තත්ත්වය කොහොමද?

**පිළිතුර -** අමුද්‍රව්‍ය හෝ ඕනෑම අමුද්‍රව්‍යයක් ආනයනය කිරීම සම්බන්ධයෙන් රටේ තිබෙන නීති සහ අවශ්‍යතාව අනුවයි අපි සොයා බලන්නේ. සමහර අමුද්‍රව්‍ය වෙළෙඳ පොළේ අධික මිලකට මිලදී ගැනීමට සිදුව තිබෙනවා. ඒ සඳහා අපිට වෙනත් ක්‍රමයක් විදියට අපි හරහා ගෙනවිත් යම්කිසි භාණ්ඩයක් අඩු මුදලකට සහන මුදලකට දෙන්න පුළුවන් නම් ඒ හැකියාව බලාගෙන යනවා. සමහර අමුද්‍රව්‍ය තිබෙනවා අපි හරහා රාජ්‍ය අංශයටත් පෞද්ගලික අංශයටත් සහන මිලට යොමු කිරීමේ හැකියාව තිබෙනවා. රටට මෙයින් වෙන සුබසිද්ධිය ගැන අපි සොයා බලමින් සිටිනවා.

**ප්‍රශ්නය -** අදවන විට රටේ ආර්ථික තත්ත්වය ක්‍රමයෙන් විසදෙමින් පවතිනවා. එය ආයතනයේ ප්‍රගතියට කොයි ආකාරයටද බලපාන්නේ.

**පිළිතුර -** රටේ ආර්ථික තත්ත්වය මත තමයි රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්පූර්ණයෙන්ම රදා පවතින්නේ. පසුගිය කාල සීමාවේදී රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ට ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ආර්ථික අර්බුදය බලපෑවා. රටේ ආර්ථිකය නැවත යහපත් අතට හැරෙනවිට නැවත ආරම්භ වෙයි ඉදිකිරීම් කටයුතු. ආර්ථිකය මේ යන විදියට ඉදිරියට ගියොත් මේ වසරේ අගෝස්තු සැප්තැම්බර් වනවිට ඉදිකිරීම් ක්ෂේත්‍රය ප්‍රමාණාත්මක වෙනසක් සිදු වෙයි. ඉදිකිරීම් වැඩිවීම තුළ අපේ ආයතනයට එය කෙලින්ම බලපානවා. ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම් සිදු කරන ප්‍රධානතම ආයතනය නිසා.

**ප්‍රශ්නය -** ආයතනයේ නව සැලසුම් සහ ඉදිරි ක්‍රියාමාර්ග මොනවාද?

**පිළිතුර -** කෙටි කාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග රැසක් අපි ගෙන තිබෙනවා. මූල්‍ය ප්‍රතිව්‍යුහගත කරන වැඩසටහන ප්‍රධාන වෙනවා. මූල්‍ය පැත්ත හදා ගත්තේ නැත්නම් ආයතනය ඉදිරියට ගෙන යන්න බෑ. පෞද්ගලික අංශයත් එක්ක එකතු වී යන්න පුළුවන් ක්‍රමවේද මොනවාද යන්න අපි මේ දිනවල බලමින් සිටිනවා. ආයතනය හරහා ලබා දිය හැකි නව අමුද්‍රව්‍ය මොනවාද කියලා අවධානය යොමු කර තිබෙනවා. සැපයුම්කරුවන් ගැන බොහෝ අවධානයක් යොමුව තිබෙනවා. නිෂ්පාදකයා හරහා කෙලින්ම අපි භාණ්ඩ මිලදී ගැනීම සිදු කරනවා. වෙනස්කම් රැසක් තුළින් අපිට ලැබෙන මූල්‍ය ප්‍රමාණය වැඩි කර ගන්න කටයුතු කරනවා. අපි මීට පෙර සිටි ක්‍රමවේදවලින් බැහැරව නව ක්‍රමවේදයකට යා යුතු වනවා. කොවිඩ් වලින් පසු සිදු වූ ආර්ථික තත්ත්වය හමුවේ අපිට අලුත් විදියට හිතන්න වෙලා තිබෙනවා. මැජික් එකක් තුළින් මෙය කරන්න අපහසුයි. මාස හයක් වැනි කාලයක් තුළ යම් ප්‍රවණතාවක් අපිට දැකිය හැකි වෙයි. ආදායම් ලබන ආයතනයක් බවට ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට යන්න පුළුවන් කියන විශ්වාසය තිබෙනවා.

නිහාර චාමික පෙරේරා

# අද චාරිකාව

# ඔබත් එන්න කොළඹ ජාතික කෞතුකාගාරයට













කොළඹ 7 ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත ඔස්සේ ගමන් කරන්නකුට ඇල්බට් චන්ද්‍රවංකයට මුහුණ ලා ඇති ධවල වර්ණ සුවිශාල ගොඩනැගිල්ලක් දිස්වෙයි. ඉපැරණි ශ්‍රී ලාංකීය පෞඪත්වය නූතනත්වයට කියාපාන ඉතාලි ගෘහ නිර්මාණ ශිල්පය අනුව මෙම ගොඩනැගිල්ල තනා ඇත්තේ මීට හරියටම වසර 146 පෙර එනම් 1877 ජනවාරි 01දාය. එය අපේ ජාතික කෞතුකාගාරයයි.

මෙරට කෞතුකාගාර සංකල්පයේ මූල බීජයන් දෙවන පෑතිස් යුගයේදී (ක්‍රි.පූ.250-210) ආරම්භ වූ බව මහාවංශය පරිශීලනයෙන් අපට අවබෝධ කරගත හැකිය.

එකළ දේවානම්පියතිස්ස රජු විසින් ලක්දිවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවූ නැවේ කුඹ ගස, සුක්කානම හා හබල තැන්පත්කර මන්දිරයක් තැනවූ බව මහාවංශ ටීකාවේ සඳහන්වේ.ඉන් පැහැදිලි වන්නේ ඈත අතීතයේ සිට ලක් වැසියන්තුළ කෞතුකවස්තු රැස්කිරීම හා නැරඹීම සඳහා ආශාවක් තිබුණ බවයි.

කොළඹ කෞතුකාගාරය සාමාන්‍ය ජනතාව අතර ප්‍රචලිත වන්නේ කොළඹ කටුගේ නමිනි. කෞතුකාගාර බොහෝවිට වස්තු විකිණීමෙහි නිරතව ඇති පුද්ගලික ගැලරි මෙන් ලාභ ඉපයීමේ චේතනාවෙන් ක්‍රියාත්මක නොවේ. 1942 අංක 31 දරණ දී ජාතික කෞතුකාගාර ආඥා පණත යටතේම යාපනය, රත්නපුර හා මහනුවර ජාතික කෞතුකාගාර බිහි වුණි. ඒ කොළඹ කෞතුකාගාරයේ පළමු ශ්‍රී ලාංකික අධ්‍යක්ෂවරයා වූයේ ආචාර්ය පී.ඊ.පී. දැරණියගල මහතා විසිනි. ඔහු 1939 සිට 1963 දක්වා එහි අධ්‍යක්ෂවරයා විය. ජාතික කෞතුකාගාරය ජාත්‍යන්තර තලයට පත්වූයේ ඔහුගේ පාලන සමයේය.

කොළඹ කෞතුකාගාරය විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා විසින් 1877 ජනවාරි 01 වන දින විවෘත කරන ලදී. ඒ වන විට කෞතුකභාණ්ඩ හා ස්වභාවික භාණ්ඩ 1192 ක් ප්‍රදර්ශනය සඳහා එක්කළ බව ලේඛන ගතව සඳහන් කර ඇත. කොළඹ කෞතුකාගාරයේ ප්‍රදර්ශනය වනුයේ ලංකාවේ සියලු පළාත් වලින් එක් රැස් කරගන්නා ලද කෞතුක භාණ්ඩ වේ. එහි ඇත්දත් කැටයම්, ලෝකඩ ප්‍රතිමා, දැව භාණ්ඩ, රෙදිපිළි, පුස්තකාල පොත්, අවි ආයුධ, සත්ව හා මානව අවශේෂ පාෂාණ වර්ග විශේෂ වේ. එම භාණ්ඩයන්ගෙන් වැඩි ප්‍රමාණයක් දුර්ලභ වන අතර අන්තැනකදී දැකිය නොහැක. උදාහරණයක් ලෙස කොළඹ කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති සිංහාසනය ඇතුළු රාජ්‍ය භාණ්ඩ වේ.

ආරම්භයේ දී පුරාවිද්‍යාත්මක අගයෙන් යුතු භාණ්ඩ සහ ශ්‍රී ලංකාවේ අත්කම් හා ස්වර්ණාභරණ වැනි භාණ්ඩ 1192ක් ප්‍රදර්ශනය සඳහා එහි තැන්පත් කර තිබිණි. ක්‍රමයෙන් එයට විවිධ භාණ්ඩ එක් වූ අතර පසු කාලයේ ඉඩකඩ මදිවීම හේතුවෙන් පුළුල් කිරීමට පියවර ගැනිණි. පරාක්‍රමබාහු රජ සමයට සහ බුවනෙකබාහු රජ සමයට අයත් සිංහල කාසි සහ රෝම වෙළෙඳුන් මෙරටට පැමිණි කාලයේ භාවිතා වූ කාසි සහ ඉංග්‍රීසි පාලන සමයේ භාවිත වූ කාසි ද්'එහි තැන්පත් කර තිබිණි. කැස්බෑ ලෙලි නිෂ්පාදන, උඩරට මැටි භාණ්ඩ, විවිධ වර්ගයේ ගිර, උඩරට පෙට්ටි ආදිය සඳහා ද විශේෂ ස්ථානයක් එහි වෙන් විය.

පාෂාණ ගැලරිය වෙන් වූයේ පුරාවිද්‍යාත්මක අගයෙන් යුතු ප්‍රතිමා, කුලුණු, පුවරු ආදිය සඳහාය. සීගිරි බිතුසිතුවම්වල පිටපත් සහ දළදා මැඳුරේ ආකෘතියක් ද එහි ප්‍රදර්ශනය කළ භාණ්ඩ අතර විය.

පසුකාලයේ ශ්‍රීමත් විලියම් හෙන්රි ග්‍රෙගරිගේ ලෝකඩ ප්‍රතිමාවක් කෞතුකාගාරය ඉදිරිපිට ස්ථාපනය කරනු ලැබුවේ ශ්‍රී ලංකාවට කෞතුකාගාරයක් ලබාදීම සඳහා ඔහු විසින් දරන ලද අපරිමිත සේවයට කෘතගුණ සැලකීමක් ලෙසිනි. කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා වූයේ ආචාර්ය ඇමරල්ඩ් හේලිය. ඔහු 1877 සිට 1901 දක්වා අධ්‍යක්ෂ ධුරය හෙබවූ අතර ඔහුගෙන් පසු ආතර් විලී අධ්‍යක්ෂ ධුරයට පත් විය.


වර්තමානයේ එහි ප්‍රදර්ශන ශාලා 16ක් දැකිය හැකිය. ඒවා නම් ප්‍රාග් ඓතිහාසික යුගය, අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය, සංක්‍රාන්ති යුගය, මහනුවර යුගය සහ පාෂාණ සහ පුරාවස්තු, චිත්‍ර, රෙදිපිළි, පිඟන් භාණ්ඩ, කාසි සහ මුදල්, ධජ පතාක, අත්කම් හා කලා ශිල්ප, අවි සහ යුද්ධෝපකරණ, චිරාගත චාරිත්‍ර, සාම්ප්‍රදායික කෘෂිකර්මය සහ ගෘහ භාණ්ඩ සඳහා වෙන්වුණු ප්‍රදර්ශන ශාලාය.

කෞතුකාගාරයේ ඔබේ කාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට, දැනට ප්‍රදර්ශනය කර ඇති ප්‍රදර්ශන මොනවාද යන්න පිළිබඳ අදහසක් සඳහා කෞතුකාගාරයේ වෙබ් අඩවියට පිවිසෙන්න. ඒ අනුව ඔබේ සංචාරය සැලසුම් කරන්න. එසේම, ජනාකීර්ණ වීම වළක්වා ගැනීම සඳහා කාර්ය බහුල නොවන වේලාවන්හිදී පැමිණීම ගැන සලකා බලන්න.

කොළඹ ජාතික කෞතුකාගාරය ශ්‍රී ලංකාවේ වැදගත් සංස්කෘතික ආයතනයක් වන අතර රටේ ඉතිහාසය හා සංස්කෘතිය ගැන උනන්දුවක් දක්වන ඕනෑම අයෙකු නැරඹිය යුතු ගමනාන්තයකි.

නාලක දහනායක

# කළු ජූලිය 83









**"ජූලි හතයි මල කෙලියයි"** යනුවෙන් ජනප්‍රිය කියමන අප බොහෝ දෙනෙකු නිරන්තරයෙන්ම මුමුණයි. ඒ සම්බන්ධ විවිධ කතන්දර ඇත. මේ ඒ සම්බන්ධයෙන් නොවේ. මේ කතාකරන්නේ "කළු ජූලිය" ගැනය. සාමාන්‍යයෙන් "ජූලි" මාසය මෙරට දේශපාලනයට, පාලකයන්ට ඉතාම අසුබ ඵලගෙන දෙන මාසයකි.

පොදුවේ සමාජය **කළු ජූලිය** යනුවෙන් හඳුන්වන්නේ 1983 ජූලි 24 වෙනිදා කොළඹින් ආරම්භ වුණු දෙමළ විරෝධී කැරැල්ලය. එම කැරැල්ල ආරම්භ වන්නේ එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් සැඟවී සිට සිදුකළ ප්‍රහාරයකින් හමුදා සෙබළුන් 13දෙනෙකු මිය යැමත් සමගය. මෙම සිදුවීමෙන් කුපිත වූ සිංහල කලහකාරී පිරිස් දකුණේ දමිළ ජනතා ඝාතනය කරමින් ඔවුන්ට නොයෙකුත් තාඩන පීඩන කරමින් වෙළඳ ව්‍යාපාර ගිනිබත් කරමින් මහා විනාශයක් සිදුකළහ. මේ හේතුවෙන් ශ්‍රී ලාංකික දෙමළ ජනතාවගෙන් විශාල පිරිසක් කැනඩාව හා ඕස්ට්‍රේලියාව ආදී රටවල සරණාගතයින් ලෙස සංක්‍රමණය වීමද සිදුවිය.

## ● LTTE සංවිධානයට ජාත්‍යන්තර සහයෝගය ලැබීමත්, දෙමළ ඩයස්පෝරාව ශක්තිමත් වීමත් 83 කළු ජූලියේ අයහපත් ප්‍රතිඵල

බොරැල්ලෙන් ආරම්භ වූ මෙම විනාශකාරී ජාතිවාදී රැල්ල දෙමටගොඩ, මරදාන, ග්‍රෑන්ඩ්පාස්, තිඹිරිගස්යාය, හැවෙලොක් ටවුන්, වැල්ලවත්ත, දෙහිවල, මොරටුව, ...

හැවේවත්ත, කොටහේන, නාරහේන්පිට, කිරුළපන, වැල්ලවත්ත, දෙහිවල, මෝදර, හා කොම්පඤ්ඤවීදිය ආදී ප්‍රදේශවලට පැතිර ගියහ. මෙම ප්‍රදේශවල දෙමළ ජාතිකයින්ගේ නිවාස හා වෙළඳසැල් කොල්ල කා, ඒවායේ බඩු බාහිරාදිය ලොරිවල පටවා රැගෙන යන තෙක් පොලීසිය සහ ආරක්ෂක අංශයන් ඉතා උදාසීන ප්‍රතිපත්තියක් අනුගමනය කළ බව ඉතා පැහැදිළිව නිරීක්ෂණය කළ හැකි වූ කරුණකි. එවකට පැවති රජය විසින් ජාතිවාදී අපරාධකරුවන්ට එරෙහිව පියවර නොගත්තත්, 83 ජූලි 30 වන දා නිකුත් කරන ලද විශේෂ ගැසට් පත්‍රයක් මගින් ජනතා විමුක්ති පෙරමුණ, නව සමසමාජ පක්ෂය, හා ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය මෙම කෝලාහල ඇවිලවූ බවට ප්‍රකාශ කරමින් තහනම් කරනු ලැබුවා. එම පක්ෂයන්හි නායකයින් රජය මගින් අත්අඩංගුවට ගෙන මීගමුව බන්ධනාගාරයේ රඳවනු ලැබුවා. ඇතැම් නායකයින් සැඟව සිටි අතර, මාස දෙකක පමණ කාලයකට පසු ඇතැම් නායකයින් නිදහස් කරනු ලැබුවා.

## ● ජනතා විමුක්ති පෙරමුණට නැවත අවි අතට ගැනීමක් සඳහා අවශ්‍ය ශක්තිය ලබාදුන්නේද කළු ජූලියයි.

මෙම සිදුවීම් මාලාව 88 /89 සමයේ දකුණේ ඇති වූ තරුණ කැරැල්ලට මග පෑදූ බව බොහොමයක් දෙනා විසින් එල්ල කරන චෝදනාවක්. එමෙන්ම මෙම සිදුවීම් නිසා ඉන්දියාව විසින් ලාංකික දෙමළ ත්‍රස්තවාදී සංවිධානවලට එරටදී යුධ පුහුණුව ලබා දීම සිදුකිරීම ඇරඹූ අතර, ඉන්දියාව, නෝර්වේ, හා ඇමරිකා එක්සත් ජනපදය ආදී රටවල් වලට ශ්‍රී ලංකාවේ කටයුතු වලට මැදිහත් වීමට මනා හේතුවක් ද වුණා. එපමණක් ද නොව LTTE සංවිධානයට ජාත්‍යන්තර සහයෝගය ලැබීමත්, දෙමළ ඩයස්පෝරාව ශක්තිමත් වීමත් 83 කළු ජූලියේ අයහපත් ප්‍රතිපල බවට නිරීක්ෂණය කළ හැකියි. එමෙන්ම කළු ජූලියේ අඳුරු සිදුවීම් පිළිබඳ සමස්ත සිංහල ජනතාව වෙතම චෝදනා එල්ල විය. මෙහිදී සිංහලයන් වරදකරුවන් හා දෙමළ ජනයා වින්දිතයන් වූ බව සත්‍යයකි. එහෙත් දෙමළ ප්‍රජාවට එරෙහි සිංහල නැගිටීම සමස්ත සිංහලයන් විසින් සිදුකරන ලද්දක් ලෙස හුවා දැක්වීම අසාධාරණය. සිංහල ජනයාගෙන් විශාල පිරිසක් දෙමළ ජනයාට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහි වූහ. විශාල අවදානමක් ගනිමින් ඔවුහු දෙමළ ජනයා ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කළහ. බොහෝ මුස්ලිම් වැසියෝ ද අසල්වැසි දෙමළ ජනයා තම නිවෙස්වල සඟවා ගැනීමට පියවර ගත්හ. එහෙත් මේවා ගැන කතාවන්නේ අඩුවෙනි.

## ● දෙමළ ප්‍රජාවට එරෙහි සිංහල නැගිටීම සමස්ත සිංහලයන් විසින් සිදුකරන ලද්දක් ලෙස හුවා දැක්වීම අසාධාරණය..

කවුරු කෙසේ කුමන ආකාරයේ අදහස්, මතිමතාන්තර පල කළත් 1983හි කළු ජූලිය ශ්‍රී ලංකාව විසින් මුහුණ දුන් 30-අවුරුදු සිවිල් යුද්ධයට මග පෑදූ එක් සිදුවීමකි.එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණට නැවත අවි අතට ගැනීමක් සඳහා අවශ්‍ය ශක්තිය ලබාදුන්නේද කළු ජූලියයි. නැවත මෙවැනි තත්ත්වයන් ඇතිවීම වළක්වා ගැනීමට පාලකයන් මෙන්ම පුරවැසියන්ද සිහි නුවණින් යුතුව වැඩ කළ යුතුය.

නාලක දහනායක

# X-PRESS PEARL

## අනතුරින් පීඩාවට පත් ධීවර ජනතාවට වන්දි



**නෞකා අනතුර හේතුවෙන් අගතියට පත් ධීවර ප්‍රජාවට අංශ 27ක් යටතේ අදියර තුනකි. ඒ රුපියල් මිලියන 1000ක පමණ වන්දි මුදල්...**

**වන්දි මුදල් ලබාගැනීමට රජය සෘජුවම මැදිහත්වේ...**

සිංගප්පූරුවේ ලියාපදිංචි එක්ස්ප්‍රස් පර්ල් නෞකාව කොළඹ වරාය අසල මුහුදේ ගිලී ගියේ ඉකුත් 2021 වසරේ මැයි මාසයේදීය. මෙම ගිනි ගැනීමත් සමඟම මෙරට ධීවර කර්මාන්තයට කණ කොකා හැඬීය. ඊටත් වඩා විශාල හානියක් සිදුකරමින් මෙරට සමස්ත පරිසර පද්ධතියටම ඇතිවූ බලපෑම තවමත් තැනින් තැන මෝදුවේ.

සංක්‍රමණික සත්ත්වයින් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය හෙවත් බොන් සම්මුතිය හා වන සත්ව, වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතට අනුවත් රැකගත යුතු විරල හා වඳවී යන සතුන් විශේෂයක් වන මුහුදු කැස්බෑවුන් මේ වන විට 150 කට අධික ප්‍රමාණයක්ද, ඩොල්ෆින් සහ තල්මසුන් ඇතුළු ජලජ ක්ෂීරපායි සතුන් 50 කට අධික ප්‍රමාණයක්ද මියගොස් ගොඩ ගසා තිබුණි.

කෙසේ වෙතත් එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුරින් ආර්ථික අපහසුතාවයට පත් ධීවරයන්ට වන්දි මුදල් ලබාදීම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය දිනෙක මීගමුව නගර සභා ශ්‍රවණාගාරයේදී සිදුවිය. එහිදී සිව්වැනි අදියරේ වන්දි මුදල වශයෙන් අගතියට පත් ධීවරයන් 300 දෙනෙකුට අමාත්‍යවරයා විසින් වන්දි මුදල් ප්‍රධානය කරනු ලැබිණ.

මෙම නෞකා අනතුර හේතුවෙන් අගතියට පත් ධීවර ප්‍රජාවට අංශ 27ක් යටතේ අදියර තුනක් යටතේ රුපියල් මිලියන 1000ක පමණ වන්දි මුදලක් ලබාදී ඇත.

එහිදී අමාත්‍යවරයා සඳහන් කළේ සියලුම දෙනා එකමුතුව එකට සිට කටයුතු කරමින් මෙම ප්‍රශ්නය ජය ගැනීමට කටයුතු කළ යුතු බවයි.

එක්ස්ප්‍රස් පර්ල් නෞකාව අනතුර සිදුවීමට පෙර වසරේදී එනම් 2020 වසරේදී නිව් ඩයමන්ඩ් නෞකාව මෙරට මුහුදු සීමාවේදී ගිනි ගැනීමට ලක්විය. අත්දැකීම් මදිවීම සහ තවත් හේතූන් නිසාවෙන් එම නෞකා අනතුරින් වන්දි මුදල් ලබාගැනීමේ අවස්ථාව අපිට මඟ හැරී ගියේය.

නමුත් එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර හේතුවෙන් අගතියට පත් මෙරට ධීවර කණ්ඩායම් සඳහා වන්දි මුදල් ලබාගැනීමට රජය සෘජුවම මැදිහත්විය. ඒ සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හෙවත් මීපා ආයතනය උපදේශක මණ්ඩලයක් මගින් තොරතුරු ලබාගැනීමට කටයුතු කළේය.

එමෙන්ම විදේශ කටයුතු පිළිබඳ හිටපු අමාත්‍ය අලී සබ්රි හා වර්තමානයේ අධිකරණ ඇමතිවරයා වශයෙන් කටයුතු කරන විජයදාස රාජපක්ෂ ඇමතිතුවරුන් මේ වන්දි මුදල් ලබාගැනීමට වෙහෙස මහන්සිවී වැඩ කළ බව ද අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.





අමිල දර්ශන හේරත්

# ඉපැරණි ගොඩනැගිලිවල ආයෝජනයට විදේශ ආයෝජකයන් සමග සාකච්ඡා

ශ්‍රී ලංකාව යනු වසර 2500 කට වැඩි ඉතිහාසයකට උරුමකම් කියන අභීත රටකි. අදටත් අප ඇස් මානයේ දක්නය ඇති පෞරාණික නටඹුන් එය අපට පසක් කර දෙයි. එම පෞරාණික නටඹුන්, ලෝකය හමුවේ අපේ අනන්‍යතාවය විදහා දැක්වීමට ඇති ප්‍රබලතම සාක්ෂියකි. එය මතු පරපුර වෙනුවෙන් රැක බලා ගැනීම සහ සංරක්ෂණය කිරීම රජයේ වගකීමකි.

*බොහෝමයක් පෞරාණික ගොඩනැගිලි නිසි නඩත්තුවක් නොමැතිව විනාශ මුඛයේ*

එම අරමුණින් මෙරට ඉපැරණි ගොඩනැගිලි පෞරාණිකත්වය ආරක්ෂා වන ලෙස නවීකරණය කිරීමටත්, ඉන් පසු එම ගොඩනැගිලි ආයෝජන අවස්ථා සඳහා ලබා දීමටත් රජය සැලසුම් කරමින් සිටී. ඒ සම්බන්ධයෙන් විදේශ ආයෝජකයින් සමග සාකච්ඡා කරමින් සිටින බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය සඳහන් කරයි. ඊට අදාළ සාකච්ඡාවක් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සහ ජෝර්ජියාවේ ශ්‍රී ලංකා කොන්සල් හසබද ඒනයඩසක්ා'ැ මහත්මිය ඇතුළු ජෝර්ජියානු ආයෝජකයින් පිරිසක් සමග නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ පසුගියදා පැවැත්විණි.

නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පාලනය වන මෙරට පෞරාණික ගොඩනැගිලි සුදුසු පරිදි ආයෝජන අවස්ථා සඳහා යොදා ගැනීම සහ ජෝර්ජියානු ආයෝජකයින් වෙත එම ආයෝජන අවස්ථා ලබා දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් මෙහිදී පුළුල් ලෙස සාකච්ඡා කෙරිණ. කඩිනමින් මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස මෙහිදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා නාගරික සංවර්ධන අධිකාරියට උපදෙස් දී තිබේ. මෙම වැඩසටහන සඳහා යොදා ගත හැකි ස්ථාන පිළබදව සොයා බලා ඒ සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකසන ලෙසද ඇමතිවරයා මෙහිදී නිළධාරීන්ට උපදෙස් දී තිබේ.

*පෞරාණික ගොඩනැගිලි සුදුසු පරිදි ආයෝජනය යොදාගැනේ*

මෙම වැඩපිළිවෙල සඳහා නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පාලනය වන කොළඹ ගෆූර් ගොඩනැගිල්ල සහ කොළඹ "එයිටි ක්ලබ්" ගොඩනැගිල්ල වැනි ස්ථාන කිහිපයක් හඳුනාගෙන තිබේ. නාගරික සංවර්ධන අධිකාරිය සඳහන් කරන්නේ රට පුරා පවතින මෙවැනි ස්ථාන පිළිබඳව මේ වන විට තොරතුරු ලබා ගනිමින් පවතින අතර එම ස්ථානද ඉදිරියේදී මෙම වැඩසටහන සඳහා යොදා ගන්නා බවයි.

මෙරට බොහෝමයක් පෞරාණික ගොඩනැගිලි නිසි නඩත්තුවක් නොමැති බැවින් විනාශ මුඛයට යමින් තිබේ. මෙරට පෞරාණික ගොඩනැගිලිවල ඓතිහාසික පෞරාණිකත්වයට හානි නොවන අයුරින් ඒවා නවීකරණය කර සුදුසු ලෙස ආයෝජන සඳහා යොදා ගැනීමෙන් මෙරටට ආදායම් උපයා ගත හැකිය. පසුගිය සමයේදී මෙරට මුහුණදී තිබූ ආර්ථික අර්බුද තත්ත්වය කෙමෙන් විසඳෙමින් පවතී. එබැවින් ඉදිරියේදී මෙරට ආයෝජන අවස්ථා පුළුල් කිරීමට විදේශීය ආයෝජකයින්ගේ සහයෝගය හිමි වනු ඇති බවට රජය විශ්වාසට පළ කරයි.







නිහාර චාමික පෙරේරා

# இன்றைய சுற்றுலா

## நீங்களும் வாருங்கள் கொழும்பு தேசிய நூதனசாலைக்கு


















கொழும்பு 7 இல் உள்ள சேர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை வழியாக பயணம் செய்பவர்களுக்கு அல்பர்ட் சந்திர வட்டத்தில் உள்ள இளம் வெள்ளை நிறத்து பென்னம் பெரிய கட்டிடம் ஒன்று தென்படும். இலங்கையின் பெருமைக்குரிய வரலாற்றை புதிய உலகத்துக்குச் சொல்கின்ற இத்தாலிய கட்டிடக்கலை நிர்மாண நுட்பங்களுக்கேற்ப கட்டப்பட்ட இந்த கட்டிடம் இன்றைய திகதிக்கு மிகச் சரியாக 146 ஆண்டுகளுக்கு முன்பு 1 ஜனவரி 1877 ஆம் திகதி ஆகும். இது நமது தேசிய நூதனசாலையாகும்.

இந்த நாட்டில் நூதனசாலை என்ற சிந்தனையின் அடிப்படை வித்துக்கள் இரண்டாவது பியதிஸ்ஸ ஆட்சிக் காலத்தில் (கிமு 250-210) ஆரம்பமானதாக மகாவம்சத்தை வாசிக்கும் எங்களுக்குப் புரிந்து கொள்ள முடியும்.

அந்தக் காலத்தில் தேவாநம்பியதிஸ்ஸ மன்னரால் இலங்கைக்கு வெள்ளரச மரக் கிளையைக் கொண்டு வந்த கப்பலின் கொடி மரம், சுக்கான் மற்றும் துடுப்பு ஆகியவற்றைக் காட்சிப்படுத்துவதற்காக கட்டிடம் ஒன்று கட்டுவித்ததாக மகாவம்சத்தின் முன்னுரையில் குறிப்பிடப்பட்டுள்ளது. இதன்படி இலங்கையின் முற்காலத்தில் இருந்தே இவ்வாறான நூதனமான பொருட்களை சேர்த்து வைத்தல் மற்றும் காட்சிப்படுத்துதலுக்கு விருப்பம் ஒன்று இருந்ததாக தெரிய வருகிறது.

கொழும்பு நூதனசாலை பொது மக்கள் வழக்கின்படி கொழும்பு முள்வீடு என்ற பெயரிலே அழைக்கப்படுகிறது. இந்த நூதனசாலைகள் பெரும்பாலும் பெறுமதியான பொருட்களை விற்பனை செய்யும் தனியார் காட்சியகங்கள் போன்ற இலாபத்திற்காக இயங்குவதில்லை. 1942 ஆம் ஆண்டின் 31 ஆம் இலக்க தேசிய நூதனசாலைகள் கட்டளைச் சட்டத்தின் கீழ் யாழ்ப்பாணம், இரத்தினபுரி மற்றும் கண்டி ஆகிய இடங்களில் தேசிய நூதனசாலைகள் உருவாக்கப்பட்டன. அவை கொழும்பு நூதனசாலையின் பணிப்பாளராக இருந்த முதலாவது இலங்கையரான கலாநிதி பீ.ஈ.பீ. தரணியகல அவர்களால் ஆகும். 1939 முதல் 1963 வரை அதன் பணிப்பாளராக இருந்தார். இவரது ஆட்சிக் காலத்தில் தேசிய நூதனசாலை சர்வதேச அளவில் முக்கியத்துவம் பெற்றது.

கொழும்பு நூதனசாலை கவர்னர் வில்லியம் கிரேகெரியால் 1, ஜனவரி, 1877 அன்று திறந்து வைக்கப்பட்டது. அப்போது நூதனசாலையில் காட்சிக்கு வரலாற்று முக்கியத்துவம் வாய்ந்த பொருட்கள் இயற்கையான பொருட்கள் 1192 காட்சிக்கு வைக்கப்பட்டிருந்ததாக ஆவணங்களில் குறிப்பிடப்பட்டுள்ளன. கொழும்பு நூதனசாலையில் காட்சிப்படுத்தப்பட்டுள்ள பொருட்கள் இலங்கையில் சகல மாகாணங்களிலும் இருந்து சேகரிக்கப்பட்ட வரலாற்று முக்கியத்துவம் வாய்ந்த பொருட்களாகும். அவற்றுள் யானைப் பற்களால் செய்யப்பட்ட சிற்பங்கள், வெண்கலச் சிலைகள், பலகையாலான பொருட்கள், ஆடை வகைகள், புத்தகங்கள், ஆயுதங்கள், மனித மற்றும் மிருகங்களின் விலங்குகள் மற்றும் மனித புதைபடிவங்கள் ஆகியன காட்சிப்படுத்தப்பட்டுள்ளன. அவற்றில் பெரும்பாலானவை அரிதானவை. வேறு எங்கும் அவற்றைக் காண முடியாது. உதாரணமாக, கொழும்பு நூதனசாலையில் காட்சிக்கு வைக்கப்பட்டுள்ள சிம்மாசனம் உள்ளிட்ட அரச இலச்சினைகள் போன்ற பொருட்கள் எதுவும் வேறு எங்கும் காட்சிக்கு வைக்கப்பட்டிருக்கவில்லை.

ஆரம்பத்தில், தொல்பொருள் ரீதியாக முக்கியத்துவம் வாய்ந்த பொருட்கள் மற்றும் இலங்கையின் கைவினைப் பொருட்கள் மற்றும் ஆபரண வகைகள் போன்றவை 1192 காட்சிப்படுத்தப்படுவதற்காக அங்கே வைக்கப்பட்டிருந்தன. அதில் படிப்படியாக பல்வேறு பொருட்கள் சேர்க்கப்பட்டு, பின்னர் இடப்பற்றாக்குறையால் விரிவாக்க நடவடிக்கை எடுக்கப்பட்டது. பராக்கிரமபாகு காலம் மற்றும் புவனேகபாகு மன்னர் காலத்தைச் சேர்ந்த சிங்களக் நாணயங்கள், ரோமானிய வணிகர்கள் நாட்டிற்கு வந்தபோது பயன்படுத்திய நாணயங்கள், ஆங்கிலேயர் ஆட்சிக் காலத்தில் பயன்படுத்திய நாணயங்கள் ஆகியவையும் அங்கு காட்சிக்கு வைக்கப்பட்டிருந்தன. கடல் ஆமை தோல் பொருட்கள், மத்திய மலைநாட்டு மட்பாண்டங்கள், பல்வேறு வகையான பாக்கு வெட்டிகள், மத்திய மலைநாட்டு பெட்டிகள் போன்றவற்றுக்கும் அங்கு தனி இடம் ஒதுக்கப்பட்டது. கற்களுக்கான காட்சிக்கூடம் தொல்பொருள் முக்கியத்துவம் வாய்ந்த சிலைகள், தூண்கள், காட்சிப் பலகைகள் போன்றவற்றிற்காக ஒதுக்கப்பட்டுள்ளது. சீகிரி சுவரோவியங்களின் பிரதிகளும் தலதா மாளிகையின் நகல் ஒன்றும் இந்த இடத்தில் காட்சிக்காக வைக்கப்பட்டுள்ளது.

பிற்காலத்தில், சேர் வில்லியம் ஹென்றி கிரேகெரி இலங்கைக்கு நூதனசாலையை வழங்குவதில் அவர் ஆற்றிய அளப்பரிய சேவைக்கு நன்றி தெரிவிக்கும் வகையில், நூதனசாலையின் முன் அவரது வெண்கலச் சிலை நிறுவப்பட்டது. கொழும்பு தேசிய நூதனசாலையின் முதல் பணிப்பாளர் கலாநிதி எமரால்ட் ஹேலிய ஆவார். அவர் 1877 முதல் 1901 வரை அதன் பணிப்பாளராக கடமையாற்றினார், அவருக்குப் பிறகு ஆர்தர் விலி நியமிக்கப்பட்டார்.

தற்போது, அங்கு 16 கண்காட்சிக் கூடங்கள் உள்ளன. அவை வரலாற்றுக்கு முந்தைய யுகம், அனுராதபுர யுகம், பொலன்னறுவை யுகம், இடைக்கால யுகம், கண்டி யுகம் மற்றும் பாறைகள் மற்றும் தொல்பொருட்கள், ஓவியங்கள், ஆடைகள், மட்பாண்டங்கள், நாணயங்கள் மற்றும் பணம், கொடிகள், கைவினைப்பொருட்கள் மற்றும் கலைப் பொருட்கள், ஆயுதங்கள் மற்றும் யுத்த உபகரணங்கள், பாரம்பரியங்கள், பாரம்பரிய விவசாயம் மற்றும் வீட்டு உபகரணங்கள் என்பவற்றுக்காக ஒதுக்கப்பட்ட கண்காட்சிக் கூடங்களாகும்.

நூதனசாலையில் நீங்கள் கழிக்கும் நேரத்தில் மிக அதிக பிரயோசனத்தைப் பெற்றுக் கொள்வதற்காக தற்போது கண்காட்சிக்கு வைக்கப்பட்டுள்ள பொருட்கள் என்னன்ன என்பது பற்றிய தகவல்களைத் தெரிந்து கொள்வதற்காக நூதனசாலையின் இணையதளத்தைப் பார்வையிடவும். அதற்கேற்ப உங்கள் பயணத்தைத் திட்டமிடுங்கள். மேலும், கூட்ட நெரிசலைத் தவிர்க்க, நெரிசல் இல்லாத நேரங்களில் பார்வையிடவும்.

கொழும்பு தேசிய நூதனசாலை இலங்கையின் ஒரு முக்கியமான கலாச்சார நிறுவனமாகும், மேலும் நாட்டின் வரலாறு மற்றும் கலாச்சாரத்தில் ஆர்வமுள்ள அனைவரும் பார்க்க வேண்டிய இடமாகும்.

முனீரா அபூபக்கர்

# නව නිවසට ගෙවදින සිත්තැ කුමරිය

ලාංකීය සිනමා ඉතිහාසයේ විශිෂ්ටතම සිනමා පටයක් වූ "පරසතුමල්" තිරගත වුණේ වර්ෂ 1966දී යි. චිත්‍රා බාලසූරිය නිෂ්පාදනය කොට ගාමිණී ෆොන්සේකා අධ්‍යක්ෂණය කර ප්‍රධාන චරිතය රඟපෑ "පරසතු මල්" චිත්‍රපටයේ බොහෝ ජවනිකා රූපගත කර ඇත්තේ අග්‍රා වලව්වෙ යි. එහි පිටගැට පෙළ බැස එන "බොනී" මහත්තයාගේ රූප රාමුව සිංහල චිත්‍රපට ඉතිහාසයේ විශිෂ්ට සලකුණක් සේ සැලකේ. එහි බොහෝ ජවනිකා රූප ගත කොට ඇත්තේ අග්‍රා වලව්වේය. මේ කතාව පරසතුමල් සිනමා පටය ගැන නොවේ. එය රූපගත කළ ගම්පහ අග්‍රා වලව්ව ගැනය.

ගම්පහ දිස්ත්‍රික්කයෙහි පරිපාලනය සිදු කරනු ලැබූ කච්චේරි සංකීර්ණය පිහිටා තිබුණේ දිගු අතීතයක් සහිත අග්‍රා වලව්ව පෞරාණික ගොඩනැගිල්ලෙහිය. අතීතයේදී මෙම මැදුරට අයිතිව පොල් වත්තට අමතරව විශාල රබර් වත්තක් ද පැවති බව පැවසෙනවා.

■ පරසතුමල් සිනමා පටයේ බොහෝ ජවනිකා රූප ගත කොට ඇත්තේ අග්‍රා වලව්වේයි.

මීට වසර සියයකට පමණ ඉහතදී මෙය ඉදිකර ඇත්තේ ඩී. ඩේවිඩ් කරුණාරත්න නමැති ව්‍යාපාරික-යාගේ නිවස ලෙස යි. ප්‍රකට වැවිලිකරුවකු වූ ඔහු තම ව්‍යාපාරික නාමය සමාජයේ රඳවා ගැනීමට යහපත් කටයුතු කිරීමට කැමැත්තක් දැක්වූවා. ඔහු ඉදිකරවූ මෙම දෙමහල් මන්දිරය පළාතේ ම කතාබහට ලක්වනවා. ඒ කාලේ මෙය ඉක්මවා යන මන්දිරයක් ගම්පහ අවට තිබී නැහැ. මෙරටට නිදහස ලැබීමෙන් පසු පාර්ලිමේන්තුවේ ගම්පහ නියෝජනය කළ ප්‍රථම මන්ත්‍රීවරයා ඩේවිඩ් කරුණාරත්න යි.

1920 දශකයේ අවසානයේ ඉදිකිරීම් ආරම්භ කළ මේ ගොඩනැගිල්ල 1930 දශකයේ මුල දී ඉදිකිරීම් අවසන් කොට ඇති බව පැවසෙනවා. මෙම මන්දිරයෙහි අලංකාර බව මෙන්ම ගෘහයට අවශ්‍ය සිසිලස ලබා ගැනීමේ අරමුණින් වටිනා ශාක සහ ඖෂධ පැළෑටි වගා කොට තිබී ඇති අතර මින් සුළු ප්‍රමාණයක් භූමියෙහි අදටත් සුරක්ෂිතව පවතින ආකාරය දක්නට ඇත.

■ 1978 දී සිට ගම්පහ කච්චේරිය හෙවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලෙසින් භාවිත කරනු ලැබුවේ අග්‍රා වලව්වයි.



අග්‍රා වලව්ව



නව දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල







සමහරුන් පවසන්නේ මැදුර තැනීමට ශිල්පීය තාක්ෂණය ලබා ගත්තේ ඉන්දියාවේ අග්‍රා ප්‍රදේශයේ ශිල්පීන්ගෙන් නිසා ඒ නම යොදා ගත් බව යි. අග්‍රා මන්දිරය ඉදිකිරීම පිණිස මෙරටට පැමිණි ඉන්දියානු කැටයම් ශිල්පීන් හා ගෘහනිර්මාණ ශිල්පීන්, කොළඹ විශ්වවිද්‍යාලයට අයත් කොලේජ් හවුස් ගොඩනැගිල්ල හා කොළඹ ශ්‍රාවස්ති මන්දිරය ද තනා ඇති බව කියවෙනවා.

■ ගම්පහ කච්චේරිය සඳහා මහල් නවයකින් යුතු ගොඩනැගිල්ලක්

අගනා කැටයම් සහිත ගෘහ භාණ්ඩ ද තවමත් වලව්වේ දකින්න පුළුවන්. මෙහි කණ්ණාඩි මේස හා අල්මාරිවල ඇති කැටයම් ජනතාව අතර ප්‍රචලිත කතා පුවත් නිරූපණය කරනවා. කුඩා දරුවකු නාන බේසම අසලට එන නාගයකුට මුගටියකු පහරදීම, නරියා සහ මිදිවැල මෙන්ම, කපුටා සහ කේජු කැබැල්ල ආදී කතා පුවත් ඒවායේ දකින්න පුළුවන්.

1978 දී සිට ගම්පහ කච්චේරිය හෙවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලෙසින් එය භාවිත කරනු ලැබුවේ අග්‍රා වලව්වයි.

වරක් මෙම ගෘහය දැකබලා ගැනීමට පැමිණි මෙරට ප්‍රවීණ විශ්ලේෂකයෙකු වන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතාද පවසා ඇත්තේ මෙය කෞතුකාගාරයක් කළ යුතු බවය.

■ අග්‍රා මන්දිරය කෞතුකාගාරයක් කිරීමට සැලසුම්

කෙසේ වෙතත් කාලයත් සමග රාජකාරී කටයුතු සඳහා මෙම ගොඩනැගිල්ල ප්‍රමාණවත් නොවීම නිසා ගම්පහ කච්චේරිය සඳහා මහල් නවයකින් යුතු ගොඩනැගිල්ලක් අග්‍රා මන්දිරයට යාබදව ඉදි වී තිබෙනවා.

එම නව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ලබන 27 වැනිදා විවෘත කිරීමට නියමිතව තිබෙනවා.

නව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විවෘත කිරීමත් සමඟ ගම්පහ දිස්ත්‍රික්කයේ සියලුම රාජ්‍ය ආයතන එකම ගොඩනැගිල්ලකට ගෙන ඒමට නියමිත බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

■ ගම්පහ දිස්ත්‍රික්කයේ සියලුම රාජ්‍ය ආයතන නව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට

2019 මාර්තු 12 වැනිදා නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල් තැබුවා. නව ගොඩනැගිල්ල ඉදිකිරීමට රුපියල් මිලියන 4000ක මුදලක් වැයවී තිබෙනවා. නව ගොඩනැගිල්ල විවෘත කිරීමෙන් පසු අග්‍රා මන්දිරය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම යටතේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙහි පූර්ණ අධීක්ෂණය මත, කෞතුකාගාරයක්, ලෙස සංරක්ෂණය කිරීමට සැලසුම් කොට ඇති බවයි පැවසෙන්නේ.

නාලක දහනායක

# හද ඇඳි රේඛා

## නොපතමි සංසාරේ...

සොඳුරු මුදු ගුණ පිරුණු හදවත හඬන හැන්දෑවේ
කවියකට පද සොයා වැළපෙන ලිහිණියෙන ගීතේ
හඬ මකාගෙන සුසුම් ඇහැරෙයි හැමදාම වාගේ
පිරී ඉතිරෙයි කළු වළාකුළු අහස් ගංගාවේ

ඇහැරුණු තැන අපේ ලෝකය සොයාගෙන ආයේ
සැරිසරන්නට නොහී ලතැවෙන විරහිනී දෑසේ
එකම පැතුමයි පිපුණෙ හිත ළඟ ඔබ දකින සිහිනේ
කඳුළු දෙන පුර හදේ කොයිබද හැංගිලා ඉන්නේ

මහ හඬින් හිත කළඹවාගෙන අඳත් වැහි වැටුණේ
ඔබේ ලොවිතුරු හිත ළඟින් හිඳ තවුස් දම් පිරුවේ
මා නොවේ මම දනිමි ඒකයි ඔබව මග හැරුණේ
මා නැතත් ජීවිතේ අහලක හිමි නොවේ සිහිනේ

ඔබට පෙම් කවි ලිය ලියා වුණු කවිකාර යුගයේ
මතක පමණයි ඉතිරි වුයේ ඔබව හමු නොවුයේ
බලා සිටි නෙත් දරාගෙන අපෙ සිත් වෙනතකයි බැඳුණේ
ඒ නිසා මම ඔබව නොපතමි සදා සංසාරේ...

- දිල් -

## මුතු නුඹට

බිඳුවක් නිදි මත නැතත්
දාහක් කවි උපදිනා මේ රැයේ
නෙත් පියන් අතර සිරවී
නුඹ සිටිනා මේ රැයේ...
නුඹ හා ගෙවු මතක
මැවි මැවි පූදිනා මේ රැයේ
බිඳුවක් නිදි මත නැතත්
දෑස් වසාගෙන මා නින්දේ...
ජීවිතේ මට එපා වෙන හැම මොහොතකම
මසිතේ පිපියන් මගේ හොඳ
සුවඳ මල...

- නුවන් දිනේන්ද්‍ර -

## සඳවතී

සිනහවක් නැති කතාවක් නැති
වේදනාබර උවනැසේ
කොහේ යන්නද කොතැන ඉන්නද
සිතන්නට බෑ සාවියේ
හදේ දුටුවද සිතේ ඇතිවද
මගේ දුක් කද සඳවතී
සිනාසෙනන්නට දුකින් ඉන්නට
දෙයක් කෝ අද මගේ ලොවේ

- භාගයා -

## වැස්ස

වැස්සට පූච්චන් වුණාට
නුඹව ඉබින්න
මට බෑ නුඹේ
තොල් සිබින්න
වැස්සක් වෙන්න
පූච්චන් නම් මට
වහිනවා නුඹ ඉන්න
ඉසව්ව යටවෙන්න

- උපුටා ගැනීමකි : මුහුණු පොතෙන් -

## ගී පද

හිත කීරි ගැහෙන්න දැනෙන ගී පද වලට
ආත්මය ඊට නතුවෙන ලෙස බැදෙනවා
දැනිලා තිබේනම් එක වතාවක් හෝ ජීවිතේට
ගලපනා වදන් හි තේරුම ඔබට දැනෙනවා

- ශිහාරා බණ්ඩාර -

## මගේ හදවත

දුවා අලුකරන මගේ ප්‍රේමය
ඔබ තුරුල්ලේම මිය දෙන්නට මට හැකිය
ඈත මානයක නුඹේ සුසුම් දිය කරන විට
බලා ඉන්නේ කොහොමද මං
ඇස් කෙවෙණි රිදෙයි හැම කල්
බලා සැනසෙන
හිත් රිදුම් දෙන
නුබේ අබියස පමණක් දිය වේවී
මගේ හදවත

- ධනු -

මේ පිටුව ඔබගේය.
ඉතිං ඔබගේ සිතෙහි මැවෙන අලුත් අදහස්, කවි විතරක් නොව නිසඳැස්වලටත් මේ පිටුවේ ඉඩ ඇත.
ඔබේ නිර්මාණ අපිට එවන්න...
වට්සප් අංකය - 0773135594

# City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING
# Magazine

පොසොන් පුර පසළොස්වක පොහොය නිමිත්තෙන් සංවිධානය කළ බත් දන්සල් බත්තරමුල්ල, සෙත්සිරිපායේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරි පරිශ්‍රයේදී සහ ගම්පහ, උඩුගම්පළ පිහිටි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ නිවසේදී පැවැත්විණි.


















මෙවර City News Magazine Youtub නාලිකාව මගින් විකාශය වන්නේ නෙළුම් කුළුණ පිළිබඳවය.

YouTube





